# සිංහල සාහිත්‍ය සංග්‍රහය

10 ශ්‍රේණිය

**<u>සිංහල සාහිත්‍ය සංග්‍රහය</u>**
**<u>මුනි සිරිපා සිඹිමින්නේ</u>**

ශ්‍රේණිය : 10
වාරය : දෙවන වාරය
නිපුණතාව : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**...ක්‍රියාකාරකම්...**

(1) පාඩම ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i.මුනි සිරිපා සිඹිමින්නේ පද්‍යයෙහි රචකයා කවරෙක් ද?
..........................................................................................................................................
ii.මෙම රචකයා නියෝජනය කරන කවි පරපුර කුමක් ද?
..........................................................................................................................................
iii.උන්වහන්සේගේ ගිහි නාමය වූයේ කුමක් ද?
..........................................................................................................................................
iv. උන්වහන්සේ උපත ලද රට නම් කරන්න.
..........................................................................................................................................
v.ආචාර්යවරයෙකු ලෙස ඔහු සේවය කළ විද්‍යාල කුමක් ද?
..........................................................................................................................................
vi.මුනි සිරිපා සිඹිමින්නේ පාඩමට පාදක වන දීර්ඝ කාව්‍යය කුමක් ද?
..........................................................................................................................................
vii.එම රචකයාගේ ළමා පද්‍ය කෘති දෙකක් නම් කරන්න.
..........................................................................................................................................
viii.කවියා විසින් දේශාභිමානය තේමා කරගෙන ලියන ලද කෘති දෙකක් නම් කරන්න.
..........................................................................................................................................
ix.මෙම රචකයාගේ කවි,ප්‍රධාන තේමා තුනක් යටතේ හඳුනාගත හැක. එම තේමාවන් මොනවා ද?
..........................................................................................................................................
x.මෙම කවියාගේ මුල් ම කාව්‍ය කෘතිය කුමක් ද?
..........................................................................................................................................

(2)මෙම ප්‍රශ්නවලට පිළිතුරු කවි පද පහත සඳහන් කොටුවෙන් තෝරා අදාළ අංකය හිස්තැනෙහි යොදන්න.

i.යුතුකම් ඉටු කළ යුතු වූයේ කුමක් සිහි කරගෙනද?
...................................................................
ii.තමන්ගේ ජීවිතයෙන් කොටසක් කැප කළ යුතු වන්නේ කුමක් වෙනුවෙන් ද?
...................................................................
iii.උතුම් පුතෙකුගේ ලක්ෂණය කුමක් ද?
...................................................................
iv.හැමදා පුතුගේ ළයෙහි තැන්පත් විය යුතු ගුණ මොනවා ද?
...................................................................
v.කවියා දකින ආකාරයට ලොවෙහි මහත් වූ ගුණය කුමක් ද?
...................................................................

vi.පුතාගේ සුුරුවිරුකම් ලෙස සැලකෙන්නේ මොනවා ද?
.....................................................................
vii.මෙලොවට පහළ වන රජෙකු ලෙස කවියා දක්වන්නේ කවර පුද්ගලයෙක් ද?
...........................................................................
viii.රට වෙනුවෙන් සටන් වැදී මියගිය විරුවන්ට සිදුවන්නේ කුමක් ද?
............................................................................

i.සිනිඳු මොළොක් බව මලෙහි
පිරිසිඳු බව පිනි බිඳෙහි
ii.ඉටුකොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
ඉවසන්නට පුළුවන් නම්
iii.රට සමය වෙතේ
iv.නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
v.මිතුරුකමින් පෙරට එතොත්
දුවිල්ලක් එක්ක වුණත්
මිතුරු වෙයන් පුතේ නුඹත්
vi.සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ
vii.කරදර දහසක් හමුවී
ඉන්ටැකි නම් සිනාවෙවී
viii.කාටත් හිමි පොදු දේ නම්
නැති බැරි හිඟ අවහිරකම්
මේ දේ මැඩගෙන දස්කම්

(3)පහත සඳහන් කවිවල කවි පේළි යෙදී ඇති ආකාරය වැරදි ය.ඒවා නිවැරදි කර නැවත කවිය ලියන්න.

i.මද සුළඟයි මේ එන්නේ ........................................................
මගේ පුතා නැළවෙන්නේ ......................................................
මුනි සිරිපා සිඹිමින්නේ .......................................................
සමනොළ ගිරි පෙදෙසින්නේ ......................................................

ii.මෙලොවට කිසි පලක් නැතේ .......................................................
කොටසක් රට සමය වෙතේ .......................................................
පුද නොකළොත් නුඹෙන් පුතේ .......................................................
තමන් ලැබූ දිවි පෙවෙතේ .......................................................

iii.ජාතික රණ දෙරණ මතේ .......................................................
සුන්දර සුරඹුන්ගෙ අතේ .......................................................
ගැටී වැටී මළ මොහොතේ .......................................................
නැළවෙන බව සිතනු පුතේ .......................................................

iv.දුවිල්ලක් එක්ක වුණත් .......................................................
මිතුරුකමින් පෙරට එතොත් .......................................................
මිතුරු වෙයන් පුතේ උඹත් .......................................................
එයයි ලොවේ ගුණය මහත් .......................................................

v.ඉවසන්නට පුළුවන්නම් ..........................................................
ලැබුණත් ලෝකෙන් ගැරහුම් ..........................................................
ඉටු කොට කළ යුතු යුතුකම් ..........................................................
උඹයි මගේ පුතා උතුම් ..........................................................

(4)පහත සඳහන් වගුවට අදාළ කවි නම් කරන්න.

| දේශාභිමානය | චරිත සංවර්ධනය |
|---|---|
| | |

(5)පහත සඳහන් වගුවට අදාළ කාව්‍යාලංකාර ඇතුළත් පද්‍ය කොටස් මෙම කොටුවෙන් තෝරා වගුව සම්පූර්ණ කරන්න.

- ජාතික රණ දෙරණ මතේ
- ජාතිය රන් විමනක් වේ
- නිදහස මහ මුහුදක් වේ
- ඉටුකොට කළ යුතු යුතුකම්
- ආගම මිණි පහනක් වේ
- එහි උල්පත පුත නුඹ වේ
- ගැටී වැටී මළ මොහොතේ

| රූපක අලංකාර | අනුප්‍රාස අලංකාර |
|---|---|
| | |

# සිංහල සාහිත්‍ය සංග්‍රහය

10 ශ්‍රේණිය

(6)පහත සඳහන් පදවල අර්ථය ලියන්න.

i.මිණි පහන් ..........................
ii.දිවිපෙවෙත ..........................
iii.සමය ..........................
iv.සුරඹුන් ..........................
v.රණ දෙරණ ..........................
vi.සුරුවිරුකම් ..........................
vii.රන් විමනක් .........................
viii.පෙදෙසින්නේ .........................
ix.ළෙහි ..........................
x.ගිරි ..........................

(7)පහත සඳහන් විචාර ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i.දරුවන් තුළ දේශාභිමානි හැඟීම් අවදි කරමින් රට දැය වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් පහදා දීමට කතුවරයා දක්වන සමත්කම උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

ii.පුද්ගල චරිත සංවර්ධනය සඳහා කවි පෙළහි අන්තර්ගත අදහස් උපයෝගි කර ගත හැකි අයුරු උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

iii.ළමා සිත් ග්‍රහණය කර ගැනීමට මෙම පැදි පෙළෙහි උපයුක්ත භාෂාවෙන් සිදු වූ මෙහෙය උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

iv.කවියාගේ අභිමතාර්ථ සාධනයෙහිලා කවියා යොදා ගත් කාව්‍ය උපක්‍රම කෙතෙක් දුරට ඉවහල් වූයේ ද යන්න උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

v.කවියා

අ.දේශාභිමානයත්

ආ.ආත්මාභිමානයත්

ළමා සිත් තුළ වර්ධනය කිරීමට ගත් ප්‍රයත්නය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

## මුනිසිරිපා සිඹිමින්නේ

## පිළිතුරු

1.)

I. එස්. මහින්ද හිමි
II. තෂි නම්ගයාල්
III. ටිබෙට් රට
IV. කොළඹ ආනන්ද විද්‍යාලය.
V. කොළඹ යුගය ( වැඩිහිටි කවි පරපුර)
VI. දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල
VII. කව්මිණ, කව්මුතු, හා ළමා කවි කළඹ
VIII. නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය ,ලංකාමාතා
IX.
- ළමයින් උදෙසා ලියූ කවි
- දේශානුරාග හා ජාතිකාභිමාන කවි
- බුද්ධාභිවන්දනා කවි

X. ඔවා මුතු

2).

| | | | |
|---|---|---|---|
| I. | - IV | VI. | - VIII |
| II. | - III | VII. | - VII |
| III. | - II | VIII. | - VI |
| IV. | - I | | |
| V. | - V | | |

3).

දේශාභිමානය

- ජාතිය රන් විමනක් වේ
- තමන් ලැබූ දිවි පෙවෙතේ
- නිදහස මහ මුහුදක් වේ
- ජාතික රණ දෙරණ මතේ

චරිත සංවර්ධනය

- කරදර දහසක් හමුවී
- ඉටු කොට කළ යුතු යුතුකම්
- කාටත් හිමි පොදු දේ නම්
- මිතුරුකමින් පෙරට එතොත්

4)

රූපක අලංකාර

- ජාතිය රන් විමනක් වේ
- නිදහස මහ මුහුදක් වේ
- ආගම මිණි පහනක් වේ
- එහි උල්පත පුත නුඹ වේ

අනුප්‍රාස අලංකාර

- ජාතික රණ දෙරණ මතේ
- ගැටී වැටී මළ මොහොතේ
- ඉටු කොට කළ යුතු යුතුකම්

5).

I. මැණික් පහන්
II. ජීවිතය පවත්වාගෙන යාම
III. ආගම
IV. දෙවඟනන්
V. සටන් බිම
VI. සූර වීරතා
VII. රන් මන්දිරයක්
VIII. ප්‍රදේශයෙන්
IX. පපුවෙහි
X. පර්වත

06). **නිදසුන් ලෙස පහත සඳහන් කවි යොදා ගත හැකි ය.**

I.
- ජාතිය රන් විමනක් වේ...
- නිදහස මහ මුහුදක් වේ...
- ජාතික රණ දෙරණ මතේ...

II.
- කරදර දහසක් හමු වී...
- ඉටු කොට කළ යුතු යුතුකම්...
- මිතුරු කමින් පෙරට එතොත්...

III.
- මුනි සිරිපා සිඹිමින්නේ...
- ජාතික රණ දෙරණ මතේ...
- සිනිඳු මොළොක් බව මලෙහී…

IV.
- නිදහස මහ මුහුදක් වේ…
- ජාතික රණ දෙරණ මතේ…
- සිනිඳු මොළොක් බව මලෙහී…

V.
(අ)
- ජාතිය රන් විමනක් වේ…
- ජාතික රණ දෙරණ මතේ…

(ආ)
- කරදර දහසක් හමුවී…
- කාටත් හිමි පොදු දේ නම්…